




ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානයේ (සන්ෆෝ) 12 වැනි සංවත්සරික සමුළුව කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්විණි.

ලෝක තරුණ වර්ෂය හා සමගාමීව පැවැති මෙම සමුළුවේදී තරුණ ජාව වෙබ් ඉංජිනේරුවරුන් කණ්ඩායමක් ස්වේච්ඡාවෙන් නිර්මාණය කළ නව වෙබ් අඩවිය විවෘත කිරීම හා ඉන්දියාවේ චන්ඩිගාර් නුවර පැවැත්වීමට නියමිත ලෝක සාම තරුණ සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල තරුණ මන්ත්‍රීවරුන් 20 දෙනකුට සමුළු ලේඛන ප්‍රදානය සිදු කෙරුණි.

සේයාරුවෙන් දැක්වෙන්නේ ජාත්‍යන්තර හා ජාතික තරුණ කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය වෙනුවෙන් හා තරුණයන් සඳහා කළ සේවය අගයමින් මහරගම හිටපු නාගරික මන්ත්‍රිනී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සමස්ත ලංකා කාන්තා සංවිධානයේ උප සභාපති සිංහ චන්ද්‍රිකා ද සොයිසා මහත්මියට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ එක්සත් ජාතීන්ගේ හැබිටාට් තරුණ උපදේශක විලියම් ජෝන් මහතා විසින් උපහාර තිළිණයක් ප්‍රදානය කළ අයුරුයි.

සන්ෆෝ අධ්‍යක්ෂ ජෙනරාල් දේශප්‍රිය එස්. විජේතුංග, සභාපති මහාචාර්ය ලක්ෂ්මන් මධුරසිංහ, දකුණු පළාත් සභා මන්ත්‍රිනී අනර්කලී ආකර්ෂා, කාන්තා ළමා කටයුතු පිළිබඳ අධ්‍යක්ෂිකා මානෙල් අයිලප්පෙරුම යන මහත්ම මහත්මීහු ද මීට සහභාගි වූහ.